# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2024/10 - 2017 ජූනි මස 20 වැනි අඟහරුවාදා - 2017.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

*මගේ අංකය*: WEDS/LND/9/ACQ/2-3.
*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය*: 4 -3/4/2014/133.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

සබරගමු පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 219 බී ගංගොඩගම ග්‍රාම නිලධාරී වසමේ ගංගොඩගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද කැඩැස්තර සිතියම් අංක 620142 කලාප 02න් 02 වැනි කලාපය පත්‍ර අංක 8 පිඹුරෙහි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.7081ක ප්‍රමාණයේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ල:

උපලේඛනය

**1. කැබලි අංක 169**

ඉඩමේ නම: වෙල්කෙප්ටියාවෙවත්ත/ගොඩපරගහහේන; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.7081.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017.07.19 වැනි දින පෙ.ව.10.00ට වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2017.07.12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. එම්. එච්. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගෙපොල.

2017 ජූනි මස 14 වැනි දින,
වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07—79